# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ගබඩා ව්‍යාපෘති (සංස්ථාගත කිරීමේ)

**ගබඩා ව්‍යාපෘති සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වික්ටර් ඇන්තනි මහතා
විසින් 2013 මැයි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 මැයි මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[240 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007033—750 (2013/03)

## ගබඩා ව්‍යාපෘති (සංස්ථාගත කිරීමේ)

### ගබඩා ව්‍යාපෘති සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ගබඩා ව්‍යාපෘති" නීත්‍යනුකූලව සංගමයක් වශයෙන් පවත්වාගෙන යාම නීත්‍යානුකූල කිරීම සඳහා කරනු ලබන කෙටුම්පතකි. එම සංගමය පිහිටුවාගෙන ඇත්තේ එකී සංගමයේ පමාර්ථ හා අවශ්‍ය කටයුතු කරගෙන යාම සඳහා එම සංගමයේ සාමාජිකයන් විසින් ගිවිසගෙන ඇති නීති රීති අනුවය. පූර්විකාව.

එකී ගබඩා ව්‍යාපෘති පිහිටුවා ගැනීමට අදාළ වූ පරමාර්ථයන් සහ එම සංගමය පිහිටුවාගැනීමට අදාළ වූ කටයුතු සාර්ථකව ක්‍රියාවේ යොදවා ඇති අතර එය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලා ඇති මෙම ඉල්ලීම මහජන සුභසිද්ධිය පිණිස හේතු වේ.

කරුණු මෙසේ හෙයින් පහත දැක්වෙන ආකාරයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ දී මෙසේ පමුණුවනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2013 අංක    දරන ගබඩා ව්‍යාපෘති (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හැඳින්වෙයි. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක කිරීමේ දින සිට හා ඉන් පසුව "ගබඩා ව්‍යාපෘති" දැනට සාමාජිකත්වය දරන්නන් හා එම සංස්ථාවක් වශයෙන් මින් පසුව සාමාජිකයන් ලෙස ඇතුළත් කරනු ලබන අය මින් පසු සංස්ථාවක් වශයෙන් වෙයාර්හවුස් ව්‍යාපෘතිය යන නමින් පවත්වාගෙන යනු ලබයි. එකී සංස්ථා නාමය යටතේ සෑම උසාවියක දී ම ඕනෑම නඩුවක් පැවරියහැකි වනු අතර පවරනු ලැබිය හැකි ය. එම සංස්ථාවට පොදු මුද්‍රාවක් තබාගැනීමේ බලය හිමිවන අතර තම කැමැත්ත පරිදි එම පොදු මුද්‍රාව යෙදවීමට හැකි ය. ගබාඩා ව්‍යාපෘති සංස්ථාගත කිරීම.

**3.** එම සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ පහත පරිද්දෙන් වනු ඇත:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) මූලික අවශ්‍යතා සැපයීමෙන් පුහුණු කිරීමෙන් හා එකිනෙකාගේ දක්ෂතා සංවර්ධනය කිරීම රැකියා

2—PL 007270—750 (2013/05)

ලබාගැනීම පිණිස උපකාර කිරීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වයන් නගාසිටුවීම මගින් රටේ සියලුම කොටස්වල වාසය කරන අඩු වරප්‍රසාද සහිත පුද්ගලයන් හට සමාජ සේවාවක් සපයනු ලැබීම;

(ආ) නාගරික හා ග්‍රාමීය ප්‍රජාවේ අඩු ආදායම් ලබන්නා වූ පවුල්වල මූලික අවශ්‍යතා සපුරා ගැනීමට හා ජීවන තත්ත්වයන් නගා සිටුවීම පිණිස උපකාර කිරීම;

(ඇ) සියලු වයස්තලවල හා විවිධ සංස්කෘතික හා ආගමික පසුබිමක් සහිත ළමා හා තරුණ කොටස් එකිනෙකාට මුනගැස්වීම හා අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාකාරී වීම තුලින් එකමුතුකම වර්ධනය කිරීම උදෙසා නිර්මාණ කලාව වේදිකාවක් වශයෙන් භාවිතයට ගැනීම;

(ඈ) සමාජීය අධ්‍යාත්මික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය මගින් සමාජයේ ඉහළ සදාචාර, ආචාර ධර්ම හා සමාජමය අගයන් වර්ධනය හා පෝෂණය කිරීම;

(ඉ) නව කුසලතා අධ්‍යයනය පිණිස තරුණ කොටස්වලට අවස්ථාවක් ලබාදීමත් රැකියා පුහුණුවක් ලබාදීම හා තම ප්‍රජාව අතරම කුඩා පරිමාණයේ ව්‍යාපාර ඇතිකර ගැනීම පිණිස උපකාරී වීම;

(ඊ) තම ප්‍රජාව තුළම ඇති අවශ්‍යතා ගැන දැනුවත් වීම පිණිස ජනතාවට අවස්ථා සලසා දීම හා එකිනෙකාට උදව් කරගැනීම, සංවර්ධනය වෙනුවෙන් සම්පත් බෙදාහදාගැනීම හා ස්වකීය ජන ප්‍රජාවේ වර්ධනය පිණිස වන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම;

(උ) මුදල් අයකරනු නොලබන සෞඛ්‍ය කඳවුරු සායන පරීක්ෂාවන් හා වෙනත් ප්‍රජා සේවා කඳවුරු සංවිධානය කිරීම හා ස්වේච්ඡා වෛද්‍ය වෘත්තිකයන්ගේ උපකාර මත අවශ්‍ය අයට නිදහස් වෛද්‍යාධාර ලබාදීම හා රටවැසියාගේ සෞඛ්‍යය හා සනීපය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම;

(ඍ) ශ්‍රී ලංකාවේ ඕනෑම ජන කොටසකට අවශ්‍යවන්නා වූ ගිණුම්කරණ, මූල්‍ය, නෛතික හා වෙනත් වෘත්තික සහය හා උපදෙස් ලබාදීම හා තමන්ගේ ජීවිත වඩාත් යහපත් ආකාරයකට පාලනය කරගැනීම පිණිස උපකාරී වීම;

(එ) රටේ විද්‍යාත්මක අධ්‍යාපනය හා සංවර්ධනය ඉහළ නැංවීම උදෙසා දිවයින පුරා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම පිණිස කටයුතු කිරීම;

(ඒ) යෞවනයන් අතර ජීවනෝපාය මාර්ග උත්පාදනය කරනු පිණිස රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් හට සහාය ලබාදීම;

(ඔ) ඉහත කියන ලද ව්‍යාපෘතීන් ආරම්භ කිරීම හා ඒවායේ උන්නතිය උදෙසා ප්‍රදාන හා වෙනත් ආකාරයේ උපකාර ලබාගැනීම හා සපයාදීම;

(ඕ) ඉහත කියන ලද ව්‍යාපෘතීන්ගේ උන්නතිය වෙනුවෙන් දේශීය හා විදේශීය සමාන අදහස් දරන පුද්ගලයන් හා ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා රැස්වීම් සමුළු හා සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කිරීමට කටයුතු කිරීම;

(ක) ගබඩා ව්‍යාපෘතියේ පරමාර්ථ සපුරාගැනීම උදෙසා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, මණ්ඩප, වැඩමුළු හා වෙනත් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම පිළියෙල කිරීම හා සංවිධානය කිරීමත් එවැනි පොත්පත්, සඟරා, නිවේදන පත්‍රිකා හා පුවත් පත් මුද්‍රණය සහ ප්‍රසිද්ධ කිරීම හා බෙදාහැරීම; සහ

(ග) ඉහත කියන ලද ඕනෑම හෝ සියලුම අරමුණු හෝ අරමුණක් සපුරාගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ පරිද්දෙන් වෙනත් සියලු කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මෙම පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානයන්ට යටත්ව චංචල හෝ නිශ්චල දේපල අත්පත් කරගැනීමේ සහ රඳවා ගැනීමේ බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ අවසන් කිරීම ද ඇපයක් සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම

හෝ එකතු කිරීමේ මුල්‍ය ප්‍රදාන, ආධාර ලබාගැනීමේ හෝ එකතු කිරීමේ ද ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවට අයත් ඕනෑම ඉඩමක ඕනෑම ගොඩනැගිල්ලක් හෝ ආකෘතියක් ස්ථාපිත කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථය ඉටුකරගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරීන් සහ සේවයෙන් බඳවාගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් අස් කිරීමේ බලතල ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු කාරණා හා දේවල් ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**5.** (1) සංස්ථාවේ කටයුතු මෙම පනතෙහි අනෙකුත් විධිවිධාන සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, ලේකම් හා භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට යටත්ව උපරිම වශයෙන් හත්දෙනෙක් දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් තෝරාපත් කරගත් අධ්‍යක්ෂ මණ්ඩලයකින් (මෙහි මින්මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් පරිපාලනය කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ ප්‍රථම වරට අධ්‍යක්ෂ මණ්ඩලය මෙම පනත ආරම්භවන දිනයට ආසන්න වශයෙන් පෙරාතුවම වූ දිනයේ දී ධුරය දැරූ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයක් සංස්ථාවේ රීතින්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා පත් කරගන්නා තෙක් රැඳී සිටිය යුතු ය.

**6.** (1) මෙම පනතේ විධිවිධානවලට අනුකූල නොවන රීතියක් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමට සහ එහි කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ඕනෑම කරුණක් මහා සභා රැස්වීමක දී සහ සාමාජිකයන් 2/3 කට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කලට සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ගීකරණය සහ සාමාජික ගාස්තු ඔවුන් ඇතුළත් කරගැනීම ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත් කරගැනීම සහ ඔවුන්ගේ බලතල හා කාර්යයන්;

(ඇ) නිලධාරි මණ්ඩලය තෝරාපත් කරගැනීම, ඔවුන්ගේ නිල කාලය, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, සේවය හැරයාම හෝ සේවයෙන් ඉවත් කිරීම හා ඔවුන්ගේ බලතල සහ කාර්යයන්;

(ඈ) අරමුදල් ඇතුළුව සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය.

(2) සංස්ථාව මගින් සාදනු ලබන ඕනෑම රීතියක් වෙනස් කිරීම, අලුතින් එකතු කිරීම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම රැස්වීමක හා (1) වන උපවගන්ති යටතේ සාදනු ලැබූ රීතියක් මෙන් කළ හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට තමා සතු අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග රික්ථාවරණ, පැවරීම්, පරිත්‍යාග, දායක මුදල් අන්තිම කැමති පත්‍රයෙන් බැහැරකිරීමක්, ගාස්තු පරිත්‍යාග සඳහා වන ප්‍රදාන හෝ මුදලින් හෝ වෙනත් ආකාරයකින් හෝ ලැබෙන දායකත්වයන් ආදී දේශීය හෝ විදේශීය පුද්ගලයින් සාමාජිකයින් හා සාමාජිකයින් නොවන තැනැත්තන් ගෙන් ලැබීම යනාදී වශයෙන් මේ දක්වා හෝ මින්මතු බාරගනු ලබන සියලුම මුදල්,

(2) ලැබෙන සියලුම මුදල් සංස්ථාවේ නමින් එක් බැංකුවක හෝ බැංකු කිහිපයක තැන්පත් කළ යුතු අතර මණ්ඩලය තීරණය කරනු ලබන ඕනෑම සුදුසු ආකාරයකින් ආයෝජනය කළ හැකි ය.

(3) සංස්ථාවේ බලතල, කාර්යභාරය සහ ඊට අදාළ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලුම වියදම් සංස්ථාවේ අරමුදල් මගින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.

8. මෙම පනත ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී සංගමයෙහි පැවති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු වන අතර, එදිනට සංගමයට ගෙවිය යුතුව තිබූ සියලු ණය, දායක මුදල් හා පරිත්‍යාග මෙම පනතේ අරමුණු සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*සාමාජිකයන්ගේ බැරකම් සීමාකිරීම.*

**9.** සාමාජික ගාස්තු වශයෙන් සාමාජිකයකුගෙන් අයවිය යුතු මුදල් ඉක්මවූ කිසිදු මුදලක් සංස්ථාවේ ණය හා බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයන් සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු යටත් නොවන්නේ ය.

*සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.*

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක්, භාරයට පත් කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපලක් භාරයේ තබා ගැනීමට නීතියෙන් සංස්ථාවට හැකිවන අතර, මෙම පනතේ පරමාර්ථයන්ට අනුව සංස්ථාව සතු ඒ සියලු දේපල විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සහ භාරයේ පවතින අවස්ථාවක දී භාරකාර මණ්ඩලයක් මගින් සපයන ලද ආකාරයෙන් කටයුතු කිරීමටත් පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාව විසින් තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව බලය පවරනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයක් වෙනුවෙන් භාවිතා නොකල යුතු ය. ඔවුන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු අතර, එය සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**12.** මෙම පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් නියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මෙම පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**13.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.